චක්‍රලේඛ අංක :- LAE/2025/70

**TR - 12**

මගේ අංකය: TR/LAE/2025/CIR
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2025. 05.04. දින.

**සියළුම ප්‍රවාහන චක්‍රලේඛයන්හි සාරාංශ ගත ප්‍රධාන චක්‍රලේඛය**

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06**
**ප්‍රවාහන කටයුතු**

2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ මූලික අවශ්‍යතා සඳහා ද ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා ද සැළකිය යුතු වාහන ප්‍රමාණයක් ඔබට අවශ්‍ය වනු ඇත. එම වාහන වලට අවශ්‍ය ඉන්ධන සැපයීම සඳහා ද රියදුරන්ට අතිකාල හා අනෙකුත් දීමනා ගෙවීම සඳහා ද, කුලී පදනම මත ලබා ගන්නා වාහන වලට කුලී ගෙවීම සඳහා ද, විශාල මුදලක් වැය වේ. එබැවින් එම වියදම් අවම කර ගැනීම සඳහා පහත දැක්වෙන උපදෙස් අනුගමනය කළයුතු වේ.

**02. රජයේ වාහන භාවිත කිරීම.**

02. (i) ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සිදුකරන නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා රජයේ වාහන පමණක් යොදා ගන්න. එම වාහන වලට අවශ්‍ය ඉන්ධන සඳහා මැතිවරණ වැය ශීර්ෂය යටතේ වියදම් දැරිය හැකි අතර, රියදුරන්ගේ සංයුක්ත දීමනා, අතිකාල දීමනා මා විසින් අනුමත කරන සීමාවන්ට යටත්ව ගෙවිය හැකිය. විශාල අළුත්වැඩියාවන් සඳහා වියදම් දැරීමට ඇති වාහන මෙම ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදවා නොගත යුතුය.

02.**(ii)** නිල වාහන හිමි ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි/ කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරී වශයෙන් පත්කර ඇති නිලධාරීන්ට තම කාර්යාලයේ /නිවසේ සිට අදාළ දිස්ත්‍රික්කයට යාම සඳහා, එම දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී හෝ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතියට යටත්ව තම නිල වාහනය යොදා ගත හැකිය. එම අනුමැතිය ලබා ගැනීම සඳහා **V-6** ආකෘතිය යොදා ගන්න. එම අනුමැතිය මත තම නිල වාහනය රැගෙන යන නිලධාරීන් අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණයට අවශ්‍ය ඉන්ධන තම පෞද්ගලික මුදලින් ලබාගෙන අදාළ බිල්පත් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කල පසු එම මුදල ප්‍රතිපූර්ණය කරනු ඇත. මේ සඳහා **AV-01** ආකෘතිය යොදා ගත යුතුය. මෙම වාහන සඳහා රජයේ රියදුරෙකු යොදා ගත යුතුය. රියදුරුගේ පැමිණීමේ සහතිකය වශයෙන් **CE-51** මුද්‍රිත ආකෘතිය යොදා ගත යුතුය. ඡන්ද විමසීමේ රාජකාරි සඳහා වාහන රැගෙන එන සෑම රියදුරු මහතෙකු සඳහාම පැමිණීමේ සහතිකයක් නිකුත් කිරීමට ප්‍රවාහන කටයුතු භාර සහකාර තේරීම් භාර නිලධාරී විසින් කටයුතු කළ යුතුවේ. කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරීන්/ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍රය තුළ ගමන් කිරීමේදී, වෙන් කරන ලද **(Assigned)** වාහන යොදා ගන්නේ නම් අදාල දිස්ත්‍රික්කය තුළ ධාවනය කරන ලද දුර ප්‍රමාණය අනුව ඉන්ධන ලබාදීමට කටයුතු කළ යුතුය. ඒ බව **AV 01** ආකෘතියේ සඳහන් කළ යුතුය. වැඩිදුර උපදෙස් සඳහා **LAE/2025/57** හා **2025.04.07** දිනැති චක්‍රලේඛය බලන්න.

02.**(iii)** තම දිස්ත්‍රික්කය තුළින් සහ ආසන්න දිස්ත්‍රික්ක තුළින් යොදවා ගන්නා රජයේ වාහන ( සංචිත වාහන) සඳහා ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් ඉන්ධන ප්‍රතිපූර්ණය කිරීම කළයුතු අතර කොළඹ සංචිතයෙන් යවනු ලබන රජයේ වාහන සඳහා පමණක් මැතිවරණ මහලේකම් කාර්යාලය විසින් ඉන්ධන ප්‍රතිපූර්ණය කරනු ලැබේ. මේ සඳහා **PV-01** ආකෘතිය යොදා ගත යුතුය.

## 03. <u>පෞද්ගලික වාහන වලින් ගමන් කිරීම වෙනුවෙන් සැතපුම් ගාස්තු ගෙවීම.</u>

03.(i) මෙම ඡන්ද විමසීමේ මූලික සංවිධාන කටයුතු හා සම්බන්ධ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් පෞද්ගලික වාහන භාවිතා නොකරන ලෙසට නිලධාරීන්ට උපදෙස් දිය යුතුය.

03 (ii). <u>උපදෙස් පන්තිවලට සහභාගි වීම.</u>

03.(ii) (1) උපදෙස් පන්ති සඳහා කැඳවුම් ලබන නිලධාරීන්ට ආයතන සංග්‍රහය අනුව සැතපුම් කුලී ලබා ගැනීමට හිමිකම් ඇත්නම් තම පෞද්ගලික වාහනය ඒ සඳහා යොදා ගත හැකිය. ඒ වෙනුවෙන් ආයතන සංග්‍රහයේ **XIV** වැනි පරිච්ඡේදයේ 8:2 උප වගන්තියේ සඳහන් පරිදි පෙට්‍රල් වාහන සඳහා කිලෝමීටරයකට රු.**12/-**ක් ද ඩීසල් වාහන සඳහා කිලෝමීටරයකට රු.**8/-** ක් ද වශයෙන් සැතපුම් කුලිය ලබාගත හැකිය. උපදෙස් පන්ති සඳහා පෞද්ගලික වාහන යොදා ගන්නා නිලධාරීන්ට සැතපුම් කුලී ගෙවනුයේ උපදෙස් පන්ති <u>කැඳවීම කරනු ලැබූ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී හෝ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් පමණි.</u> තම සේවා ස්ථාන මගින් සැතපුම් කුලී ගෙවා එම මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මැතිවරණ මහ ලේකම් කාර්යාලය වෙත එවනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03.(ii).(2) උපදෙස් පන්ති සඳහා කැඳවුම් ලබන නිලධාරීන්ට තම නිල වාහන/ වෙන්කල වාහනවලින් තම ස්ථිර සේවා ස්ථානයේ සිට උපදෙස් පන්ති පවත්වන ස්ථානය දක්වා පැමිණීමට සහ ආපසු සිය සේවා ස්ථානය වෙත යාම සඳහා අදාළ තේරීම්භාර නිලධාරීට, නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්ට අනුමැතිය දිය හැකිය. තවද, <u>නිල වාහන / වෙන්කල වාහන යොදා ගන්නා නිලධාරීන් උපදෙස් පන්ති වලට සහභාගි වීමට යාම සඳහා ඉන්ධන අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා උපදෙස් පන්ති කැඳවීම් සිදුකළ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හරහා ලිඛිතව මැතිවරණ කොමසාරිස් ජනරාල් විමසීම මැනවි.</u> වැඩිදුර උපදෙස් සඳහා අංක **LAE/2025/57** හා **2025.04.07** දිනැති චක්‍රලේඛය බලන්න.

03.(iii) තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ සහකාර තේරීම්භාර නිලධාරී වශයෙන් හෝ ඉන් බැහැර දිස්ත්‍රික්කයක හෝ එම ධූරයේ මැතිවරණ රාජකාරී සඳහා පත්කරනු ලැබ සිටින නිලධාරීන්ට එම රාජකාරී සඳහා යාමට තම පෞද්ගලික මෝටර් රථය යොදා ගැනීම සඳහා **V-4** ආකෘතිය මගින් අදාල තේරීම්භාර නිලධාරීගේ හෝ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්ගේ හෝ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. එසේ පැමිණෙන නිලධාරීන්ට තම ස්ථිර සේවා ස්ථානය හෝ ආයතන සංග්‍රහයේ සඳහන් සීමාවන්ට යටත්ව නිවසේ සිට හෝ අදාල තේරීම්භාර නිලධාරී කාර්යාලය වෙත එක් වරක් පැමිණීමට හා ආපසු යෑමට යටත්ව සැතපුම් කුලිය ගෙවිය හැක. කොළඹින් දුර බැහැර පළාත් වල රාජකාරී පැවරී ඇති එබඳු නිලධාරීන්ගේ ඉල්ලීම් අනුමත කළ යුත්තේ රජයට අධික වැය බරක් දැරීමට සිදු නොවන්නේ නම් පමණි. වැඩිදුර උපදෙස් සඳහා **LAE/2025/57** හා **2025.04.07** දිනැති චක්‍රලේඛය බලන්න.

03.(iv) <u>පෞද්ගලික වාහන සඳහා පෞද්ගලික රියදුරෙකු යොදවා ගැනීම.</u>

සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් තෝරාගෙන ඇති නිලධාරියෙකුට එම දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී, නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතියට යටත්ව තම පෞද්ගලික වාහනය රැගෙන ඒමේදී ඔහුට අවශ්‍ය නම් පෞද්ගලික රියදුරෙකු යොදවා ගත හැකිය. රියදුරුට ගෙවනු ලබන දීමනාව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් රැගෙන එන වාහනයට යොදා ගන්නා රියදුරුට ගෙවනු ලබන දීමනාවම වේ. (මේ සම්බන්ධයෙන් නිකුත් වන මැතිවරණ රාජකාරී සඳහා ගෙවීම් චක්‍රලේඛය බලන්න. ) එසේ පැමිණෙන රියදුරන් සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) භාරයේ ඇති **V-5** ආකෘතිය පිටපත් දෙකකින් සම්පූර්ණ කර භාරදිය යුතුය. රාජකාරී අවසානයේදී එම ආකෘතියේ "ආ " කොටස සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) ලවා සම්පූර්ණ කරවාගෙන ඉන් පිටපත් දෙකක් ආපසු ලබාගෙන එක් පිටපතක් රියදුරුගේ පැමිණීමේ සහතිකය ලෙස ද අනික් පිටපත තම ගෙවීම් වවුචරයේ පැමිණීමේ සහතිකය වශයෙන් ඇමිණිය යුතුය. වැඩිදුර උපදෙස් සඳහා **LAE/2025/56** හා **2025.04.07** දිනැති චක්‍රලේඛය බලන්න.

03.(v) පෞද්ගලික වාහන රැගෙන පැමිණෙන නිලධාරීන් තමන් පැමිණි වහාම තම වාහනයේ ආදායම් බලපත්‍රයේ ඡායා පිටපතක්ද **V-4** ආකෘතියේ පිටපත් දෙකක්ද සමග සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදිය යුතුය. <u>රාජකාරී අවසානයේදී **V-4** ආකෘතියේ "ආ" කොටස සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) ලවා සම්පූර්ණ කරවාගෙන එක් පිටපතක් ලබාගත යුතු අතර එය තම ගමන් වියදම් වවුචරයට ඇමිණිය යුතුය. එම ආකෘතිය නොමැතිව ගෙවීම් කරනු නොලැබේ.</u> මෙම ආකෘතියට අත්සන් කරන සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) විසින් තම සම්පූර්ණ අත්සන තැබිය යුතු අතර, තම නම හා ස්ථිර පදවි නාමය දක්වන රාජකාරී මුද්‍රාව ද තැබිය යුතු වේ. ඉදිරිපත් කරනු ලබන සහතික වල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට අපේක්ෂා කරනු ලබන හෙයින් ඒවා අත්සන් කිරීමට බලය පවරනු ලැබූ නිලධාරීන්ගේ නම් ආදර්ශ අත්සන සහිත ලේඛනයක් මා වෙත පසුව ඉදිරිපත් කළයුතු වේ. වැඩිදුර උපදෙස් සඳහා **LAE/2025/56** හා **2025.04.07** දිනැති චක්‍රලේඛය බලන්න.

**04.** <u>**ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් පෞද්ගලික වාහන ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදා ගැනීම.**</u>

04.(i) තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ ඡන්ද පොළ රාජකාරී සඳහා පත්කරනු ලබන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් තම ඡන්ද පොළේ ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා ආදිය රැගෙන යාමට හා ආපසු රැගෙන ඒමට වාහනයක් යොදාගනු ලබන්නේ නම්, ඒ සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී / නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. එසේ රැගෙන එනු ලබන වාහන සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව පෙට්‍රල් වාහන සඳහා කිලෝමීටර් එකකට රු.**52/-** බැගින් ද, ඩීසල් වාහන සඳහා කිලෝමීටරයකට රු.**47/-** බැගින් ද ගෙවීම් කළ හැකිය. <u>**මෙම ගෙවීම් අදාල වනුයේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුවිසින් රැගෙන එනු ලබන පෞද්ගලික වාහන සඳහා පමණි. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුවිසින් රැගෙන එන පෞද්ගලික වාහන සඳහා ගෙවීම් කිරීමේ දී කුලී පදනම මත ලබාගන්නා වාහන සඳහා ගෙවීම් කරනු ලබන ගාස්තු මත ගෙවීම් කිරීම කිසිවිටෙකත් නොකළ යුතුය. පහත සඳහන් කොන්දේසි වලට යටත්ව මෙම වාහන ලබා ගත යුතුය.**</u>

<u>කොන්දේසි</u>

- එම වාහනය මහජන කැළඹිලි හා කැරලි කෝලාහල ආවරණය වන පූර්ණ රක්ෂණය සහිත වාහනයක් වීම.
- ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වාහනය නොපැදවිය යුතු අතර, ඒ සඳහා පෞද්ගලික රියදුරකු යොදාගත යුතුය. රියදුරුට දිනකට ගෙවනු ලබන සංයුක්ත දීමනාව හා ඊට නියමිත කාල සීමාව පිළිබඳ උපදෙස් මැතිවරණ ගෙවීම් පිළිබඳව මවිසින් නිකුත් කරනු ලබන ගෙවීම් චක්‍රලේඛයෙහි වැඩිදුරටත් සඳහන් කරනු ඇත.
- එම වාහනය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති සහායක, පොලිස් නිලධරයකු හා රියදුරු ඇතුළු අවම හතර දෙනෙකුට පහසුවෙන් ගමන් කළ හැකි විය යුතු අතර, එම අයගේ ගමන් මළු, ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් ආරක්ෂක ද්‍රව්‍ය රැගෙන යාමට ද ඉඩ පහසුකම් තිබිය යුතුය.
- මේ සඳහා මරුටි, මාර්ච්, ස්ටාර්ලට් වැනි කුඩා කාර් (**Beetle Cars**) භාවිත නොකළ යුතුය.
- වාහනය ඉතා හොඳ ධාවන තත්වයෙන් තිබිය යුතුය.
- මෙසේ වාහන රැගෙන එන සෑම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකුම ඊට නියමිත **V-3** තොරතුරු පත්‍රිකාව පිටපත් තුනකින් පුරවා සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) වෙත භාරදිය යුතුය.
- ආපසු පැමිණීමේදී ඉහත පිටපත් වල "**B** "කොටස සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) විසින් සම්පූර්ණ කර, ඉන් පිටපත් දෙකක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත භාර දිය යුතුය. ඉන් එක් පිටපතක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වාහනයට අදාළ ගෙවීම් වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු අතර, අනෙක රියදුරුගේ ගෙවීම් වවුචරයට ඇමිණිය යුතුය.

- ඉහත පරිදි කිලෝමීටර් ගාස්තු ගෙවිය යුත්තේ අදාල වාහනය ඡන්ද පොළ වෙත ඡන්ද පෙට්ටි රැගෙන යාමට සහ ඡන්ද විමසීමෙන් පසු එම ඡන්ද පෙට්ටි ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත භාරදීම සඳහා ආපසු රැගෙන ඒමට සම්පූර්ණ ලෙසම යොදා ගනු ලැබී නම් පමණි.

04.(ii) ඉහත 04 (i) ඡේදයට අනුකූලව වාහන රැගෙන එන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකුගේ නිවස තම සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ පිහිටියේ නම්, ඔහු පිටත්වූ ස්ථානය නිවස සේ සලකා ඔහුට නියමිත ඡන්ද මධ්‍යස්ථානය දක්වා යාමට හා ආපසු තම නිවස දක්වා ගමන් කිරීමට ද කිලෝමීටර් ගාස්තු ගෙවීමට ඉඩදිය හැකිය. **<u>මෙලෙස වාහන රැගෙන එන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට කරනු ලබන ගෙවීම් මැතිවරණ කාර්යාල වලින් පමණක් කළයුතු අතර,</u>** වෙනත් කාර්යාල මඟින් ගෙවීම් කර ප්‍රතිපූර්ණය කරවා ගැනීමට කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ගෙවීම් සම්බන්ධ විධිමත් උපදෙස් ඇතුළත් චක්‍රලේඛයක් ඡන්ද විමසීම නිමවීමෙන් පසු නිකුත් කරනු ලබන අතර, වැඩිදුර උපදෙස් සඳහා **LAE/2025/45** හා **2025.03.31** දිනැති චක්‍රලේඛය බලන්න.

**05. <u>කුලී පදනම මත වාහන ලබාගැනීම.</u>**

05. (i) රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා සතු වාහන සංඛ්‍යාව සීමිත වීම නිසා දිස්ත්‍රික්කය තුලින් ලබාගත හැකි වාහන ප්‍රමාණය ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යෙදවීමට ප්‍රමාණවත් නොවනු ඇත. එබැවින් මෙම ඡන්ද විමසීමේදී ද දිස්ත්‍රික්කය තුලින් ඔබගේ අවශ්‍යතාවය පරිදි පෞද්ගලික වාහන ලබා ගැනීමට කටයුතු කළ හැකිය. කුලී පදනම මත ලබාගන්නා වෑන් රථ එක් ඡන්ද මධ්‍යස්ථානයක රාජකාරී සඳහා පමණක් සීමා නොකළයුතු අතර හැකි සෑම විටම ඡන්ද මධ්‍යස්ථාන දෙකක රාජකාරී ආවරණය වන පරිදි යෙදවිය යුතුය.

05. (ii) මෙසේ කුලී ගෙවීමේ පදනම මත ලබා ගන්නා වාහන හොඳ ධාවන තත්වයේ තිබිය යුතු අතර, පූර්ණ රක්ෂණයක් සහිත ඒවා විය යුතු වුවද, අවශ්‍යතාව මත තුන්වන පාර්ශවීය රක්ෂණය සහිත වාහන ද යොදා ගත හැකිය. එහෙත් යම් අනතුරකදී හෝ අලාභයකදී මැතිවරණ කොමිෂන් සභාව ඊට කිසිසේත්ම මැදිහත් නොවන බවට ඔවුන්ට කල්වේලා ඇතිව ලිඛිතව දැනුම්වත් කළ යුතු අතර, ඊට ඔවුන්ගේ ලිඛිත එකඟතාව ලබාගත යුතුය.

05.(iii) කුලී ගෙවීමේ පදනම මත ලබා ගන්නා වාහන සඳහා ගෙවිය හැකි ගාස්තු ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ. වැඩි විස්තර සඳහා **LAE/2025/42** හා **2025.03.31** දිනැති චක්‍රලේඛය බලන්න.

| **කි.මී.1 ක් සඳහා අනුමත ගාස්තු** | | |
|---|---|---|
| වාහන වර්ගය | පෙට්‍රල් වාහන | ඩීසල් වාහන |
| ආසන 08 අඩු වෑන් / ජීප් | රු.125.00 | රු.120.00 |
| ආසන 08-14 ත් අතර වාහන | රු.130.00 | රු.140.00 |
| ආසන 15-25 අතර වාහන | | රු.150.00 |
| ආසන 26-39 අතර වාහන | - | රු.160.00 |

5.(iv) මෙවර පළාත් පාලන ඡන්ද විමසීම සඳහා වාහන වැඩි ප්‍රමාණයක් අවශ්‍යව ඇති බව අනාවරණය වී ඇති හෙයින් ඉහත කුලී පදනම මත ලබා ගන්නි වාහන වලට අමතරව කාර් රථ හා කැබ් රථ ලබා ගැනීම කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු විය. ඒ අනුව අංද **LAE/2025-73** හා 2025.05.01 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලදී. ඒ අනුව කාර් රථ හා කැබ් රථ සඳහා ගෙවිය හැකි ගාස්තු ප්‍රමාණයන් පහත පරිදි වේ.

| කි.මී.1 ක් සඳහා අනුමත ගාස්තු | | |
|---|---|---|
| වාහන වර්ගය | පෙට්‍රල් වාහන | ඩීසල් වාහන |
| කාර් | රු. 100.00 | - |
| කැබ් | - | රු.95.00 |

5(v) ඉහත 5(iii) හා 5(iv) පරිදි ලබාගන්නා වාහන සඳහා ඉහත සඳහන් ගාස්තු වලට අමතරව තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ වේලාවේ සිට තේරීම්භාර නිලධාරී විසින් වාහනය මුදාහල වේලාව දක්වා වූ කාල සීමාවට රඳවා ගැනීමේ ගාස්තුව වශයෙන් පැයකට රුපියල් 100.00 ක මුදලක් ගෙවිය හැක.

05.**(vi)** ඉහත 5(iii) හා 5(iv) හි දැක්වෙන මිල ගණන් යටතේ කුලියට ලබාගත් වාහන තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කිරීමෙන් අනතුරුව ගතවූ මුළු කාලය තුළදී යටත් පිරිසෙයින් කි.මී.50 ක් හෝ ධාවනය නොවූ අවස්ථාවකදී, එම වාහන සඳහා කි.මී.50 ක් සඳහා වූ අවම ගාස්තුවක් ගෙවිය හැකි අතර කි.මී.50-100 දක්වා ධාවනය වූ අවස්ථාවලදී එම වාහන සඳහා කි.මී.100 ක් සඳහා ද කි.මී.100 ට වැඩියෙන් ධාවනය වන අවස්ථාවලදී ධාවනය කල දුර ප්‍රමාණයට අදාල ගාස්තුව ද ගෙවිය යුතුවේ.

5(vii). ඉහත 5(iii) හි දැක්වෙන මිල ගණන් යටතේ කුලියට ලබාගත් වාහන සඳහා කිලෝමීටරයකට ගෙවනු ලබන අනුමත ගාස්තු ප්‍රමාණයට අමතරව දින දෙකක් සඳහා රියදුරු සඳහා වූ ගෙවීමක් ලෙස දිනකට රු.750.00 බැගින් (ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීමේ දින) රු.1500.00 ක විශේෂ දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ආසන 26 ට වැඩි වාහන සඳහා යොදවා ගන්නා රිය සහායකවරුන්ට ද ගෙවිය හැකිය.

05.**(viii)** දිස්ත්‍රික්කය තුලින් ලබා ගන්නා මෙම වාහන නවතා තබන ස්ථානයේ සිට වාර්තා කළයුතු ස්ථානය දක්වා රැගෙන ඒමට සහ ආපසු රැගෙන යාමට (දිස්ත්‍රික්කය තුළ) ධාවනය කරන දුර ප්‍රමාණය සඳහා ද ඉහත 5(**iii**) හා **5(iv)** ඡේදයේ සඳහන් පරිදි කිලෝමීටරයකට අදාල ගාස්තු ගෙවිය හැක. එහෙත් වාහනයක් කිසියම් රාජකාරියක නිරත කරවීමට අපේක්ෂා කළ අවස්ථාවක කාර්මික දෝෂයක් හෝ වෙනත් හේතුවක් හෝ නිසා ධාවනය කළ නොහැකි වී නම් එවැනි වාහන සඳහා කිසිදු ගාස්තුවක් නොගෙවිය යුතුය. වැඩිදුර විස්තර සඳහා **LAE/2025/42** හා **2025.03.31** දිනැති චක්‍රලේඛය සහ **LAE/2025/**73 හා **2025.05.01** දිනැති චක්‍රලේඛය බලන්න.

05.**(ix)** කුලී පදනම මත ලබාගන්නා වාහන යොදාගත හැක්කේ ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා සමග ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඡන්ද පොළවල් වෙත යැවීම හා ආපසු ගෙන්වා ගැනීම සඳහා සහ අවශ්‍ය දිස්ත්‍රික්කවල ඡන්ද පොළ කාර්ය මණ්ඩලය තේරීම්භාර නිලධාරී කාර්යාලයේ සිට ඡන්ද පොළ වෙත යැවීම හා ආපසු ගෙන්වා ගැනීමට ද, අවශ්‍යතාවය මත කොට්ඨාස භාර තේරීම්භාර නිලධාරීන්ට වෙන්කර දීම සඳහා ද පමණි. <u>**සුභ සාධක කටයුතු හෝ වෙනත් කම්වූ රාජකාරී සඳහා පුද්ගලික වාහන යොදා නොගත යුතුය. කුලී පදනම මත ලබා ගන්නා වාහන වලට හැර වෙනත් කිසිදු වාහනයක් සඳහා කුලී පදනම මත වූ ගාස්තු ගෙවීම් නොකළ යුතුය.**</u>

05.**(x)** වාහන සංචිත පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත වාහන ලබා නොගත යුතුය. මැතිවරණයට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සහ ඡන්ද පොළ කාර්ය මණ්ඩලය ඡන්ද පොළ බලා පිටත් කර හැරීමෙන් පසු ඉතිරි වූ සියළු කුලී වාහන (කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරීන් සඳහා යොදා ගැනීමට අපේක්ෂිත වාහන හැර) නිදහස් කර ආපසු යැවිය යුතුය. <u>**ඡන්ද පොළ කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා යොදා ගනු ලැබූ කුලී වාහන ඡන්ද විමසීම අවසානයේ තේරීම්භාර නිලධාරී කාර්යාලය වෙත ආපසු පැමිණි පසු වෙනත් කාර්යයක නොයොදා හැකි ඉක්මනින් නිදහස් කර යැවිය යුතුය.**</u>

## 06. ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ බස් රථ යොදා ගැනීම.

06.(i) මෙම ඡන්ද විමසීමේදී ද කාර්ය මණ්ඩලය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍යයන් ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයෙන් පොදු ගාස්තු ක්‍රමයක් යටතේ බස් රථ ලබාගත හැකිය. ඒ පිළිබඳව අවශ්‍ය උපදෙස් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට ලබාදී ඇත. ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය බස්රථ ප්‍රමාණය ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ආසන්නතම ඩිපෝවෙන් සපයා දීමට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය කටයුතු යොදනු ඇත. ඒ සඳහා සමීපතම ඩිපෝවේ ඩිපෝ අධිකාරී, ධාවන කළමණාකරු සමග සාකච්ඡා කර අවශ්‍ය බස්රථ ප්‍රමාණය ලබා ගැනීමට කරුණාකර කටයුතු කරන්න. වැඩිදුර තොරතුරු සඳහා **LAE/2025/43** හා **2025.03.31**දිනැති චක්‍රලේඛය බලන්න.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් ලබා ගන්නා බස් රථ සඳහා ගෙවීම් කිරීමේදී පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් මත ගෙවීම් කිරීමට කටයුතු කරන්න.

| විස්තරය | ආසන 40 ට වැඩි සාමාන්‍ය බස්රථ සඳහා ගාස්තුව | ආසන 40 ට අඩු සාමාන්‍ය බස්රථ සඳහා ගාස්තුව |
|---|---|---|
| එක් දිනකට අවම අය කිරීම<br>අවම ගාස්තුව යටතේ ධාවනය කළ හැකි උපරිම කි.මී. ප්‍රමාණය කි.මී. 100<br>ලබාදිය හැකි උපරිම කාලය පැය 12 | රු.30,000.00 | රු.27,000.00 |
| කි.මී.100 ට වැඩි වූ විට අමතර කි.මී.1 කට ගාස්තුව | රු. 165.00 | රු. 165.00 |
| ලබා දෙන කාලය ඉක්මවන අමතර සුක්කානම් පැයක් සඳහා අය කිරීම.<br>( අමතර කාලය ගණනය කිරීම කි.මී.10 සඳහා පැය 01 ) | රු. 500.00 | රු. 500.00 |
| එක් දිනක් සඳහා රාත්‍රී නැවතුම් ගාස්තුව | රු. 1,500.00 | රු. 1,500.00 |

06.(ii) ඉහත අංක 06.(i)ඡේදයේ සඳහන් ගෙවීම් වලට අමතරව රියදුරු සඳහා වූ ගෙවීමක් ලෙස දිනකට රු.900/- ක මුදලක් ගෙවිය හැකිය. රිය සහායකවරයෙකු (කොන්දොස්තරවරයෙකු) සිටී නම් ඔහු වෙනුවෙන් ද දිනකට රු.900/- ක මුදලක් ගෙවිය හැකිය. මෙම බස්රථ ඡන්ද විමසීමේ දිනයට පෙරදින (එනම් 2025.05.05 දින) උදෑසන නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත කැඳවීම ප්‍රමාණවත් වන අතර, ඒ අනුව දින දෙකකට මෙම ගෙවීම කළ හැකිය.` ඡන්ද ගණන් කිරීමේ කටයුතු අවසාන වීමෙන් පසු එම කාර්ය මණ්ඩලය දුම්රිය ස්ථාන හෝ බස් නැවතුම් පළවල් හෝ වෙත යැවීමට රජයේ වාහන නොමැති අවස්ථාවලදී පමණක් දිස්ත්‍රික්කය තුළ ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ කිහිපයක් ගෙන්වා තබා ගැනීම සුදුසු වනු ඇත. එහෙත් එම බස්රථ කුමන හේතුවක් නිසාවත් දිස්ත්‍රික්කයෙන් බැහැර ධාවනයට නොයෙදිය යුතුය.

## 07. පෞද්ගලික බස් රථ සංගම් වලින් ලබා ගන්නා බස් රථ.

07.(i) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ වලට අමතරව ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයෙන් ද ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය බස්රථ ලබා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ඇත.මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද **LAE/2025/44** හා **2025.03.31** දිනැති චක්‍රලේඛයෙන් ලබාදී ඇති උපදෙස් පරිදි කටයුතු කරන්න. එම බස් රථ ලබාගැනීමට එකඟවූ ගාස්තු ප්‍රමාණයන් පහත දැක්වෙන අතර, එම ගාස්තු යටතේ ඡන්ද විමසීම නිමවීමෙන් පසු ගෙවීම් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

### දිස්ත්‍රික්කය තුළ ධාවනයේ දී දිනකට ගෙවීම.

| | ආසන 42 හෝ ඊට වැඩි (රුපියල්) | ආසන 30 සිට 40 දක්වා (රුපියල්) | ආසන 25 සිට 29 දක්වා (රුපියල්) |
|---|---|---|---|
| කි.මී. 50 දක්වා | 18,850.00 | 16,850.00 | 15,850.00 |
| කි.මී.51 සිට 75 දක්වා | 20,850.00 | 18,850.00 | 17,850.00 |
| කි.මී.76 සිට 100 දක්වා | 23,850.00 | 21,850.00 | 20,850.00 |
| කි.මී. 101 සිට 125 දක්වා | 26,850.00 | 24,850.00 | 23,850.00 |
| 125 ට වැඩිවන විට කි.මී. 1 කට | 250.00 | 200.00 | 200.00 |

මෙම බස් රථ ඡන්ද විමසීමේ දිනයට පෙරදින එනම් **2025.05.05** දින උදැසන නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත කැඳවීම ප්‍රමාණවත් වන අතර, ගෙවීම් කිරීමේදී දින දෙකකට ගෙවීම් කළ හැකිය.

**1.** ඉහත ගෙවීම් වලට අමතරව රියදුරුට දිනකට රු.900.00 ක දීමනාවක් ගෙවිය හැකිය. රිය සහායකවරයෙකු සිටී නම් ඔහු වෙනුවෙන් ද දිනකට රු.900.00 ක දීමනාව ගෙවිය හැකිය.

**2.** ඉන්ධන ලබාදීම හෝ රඳවා ගැනීමේ ගාස්තු ගෙවීම යන කිසිවක් සිදු නොකල යුතුය.

**3.** බස් රථ ලබාගත යුත්තේ අදාළ දිස්ත්‍රික්කය තුළ ගාල් කරනු ලබන ඒවායින් පමණි.

**4.** මෙම බස් රථ ලබාගැනීමේදී ඡන්ද විමසීම් දිනට පෙර දින (**2025.05.05** දින) උදැසන නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත ගෙන්වා ගෙන ඡන්ද විමසීම අවසන් වී ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ඡන්ද පෙට්ටි භාරදුන් වහාම නිදහස් කර යැවිය යුතුය. (එවිට ගෙවීම් කිරීමට සිදුවනුයේ දින දෙකකට කුලී ගාස්තුව සහ දින දෙකකට රියදුරු / රිය සහායක යැපීම් දීමනාව පමණි.)

07.**(ii)** ඡන්ද විමසීම් දිනට පෙර දින රාත්‍රියේ අදාල ඡන්ද මධ්‍යස්ථානයන්හි බස් රථ ගාල්කර තැබිය යුතුය. වැඩි විස්තර සඳහා මීට අදාළ **LAE/2025/44** හා **2025.03.31**දිනැති චක්‍රලේඛය බලන්න.

### 08. වතු සමාගම්වලින් ලබා ගන්නා වාහන

වතු සමාගම් සතු වාහන එම සමාගම් විසින් නඩත්තු කරනු ලබන හෙයින් එම වාහන ඡන්ද පොළ රාජකාරි සඳහා යොදා ගනු ලබන්නේ නම් එම වාහන ද, පෞද්ගලික අංශයෙන් කුලියට ලබා ගන්නා වාහන සේ සලකා මෙම චක්‍රලේඛයේ 05.**(iii)** උප වගන්තියේ සඳහන් පරිදි ගෙවීම් කළ යුතු වේ. ධාවනය කරන සැතපුම් ප්‍රමාණය අනුව ගාස්තු ගෙවීමට සිදුවන හෙයින්, වතු සමාගම් වල වාහන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය හෝ ඡන්ද පොළ වෙත යැවීම හා ආපසු ගෙන්වා ගැනීමේ කාර්යයට පමණක් යෙදිය යුතුය. එම වාහන වලට අදාල ගෙවීම් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී කළයුතු අතර, ඔවුන්ගේ ගෙවීම් පිළිබඳ ඉල්ලීම් මැතිවරණ මහලේකම් කාර්යාලයට ඉදිරිපත් නොකළ යුතු බවට උපදෙස් දෙන්න.

### 09. සංස්ථා, මණ්ඩල හා බැංකු සතු වාහන

සංස්ථා මණ්ඩල හා බැංකු ආදියෙහි වාහන වෙනුවෙන් කුලී ගෙවීමක් හෝ සැතපුම් ගාස්තු ගෙවීමක් හෝ නොකෙරෙන නමුත්, <u>එම රියැදුරන්ට ගෙවන අතිකාල ගාස්තු ප්‍රමාණය රජයේ දෙපාර්තමේන්තුවල රියදුරන්ට ගෙවන ගාස්තු ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයකින් වැඩිවේ. එහෙයින් වියදම් අඩු කර ගැනීම සඳහා එම වාහන ඡන්ද විමසීම පැවැත්වෙන දිනයට පෙර දින සේවයට කැඳවීමට ද ඡන්ද විමසීම් දිනට පසුදින පෙරවරුවේම සේවයෙන් නිදහස් කිරීමට ද කටයුතු කළ යුතුය.මෙම වාහන ඡන්ද විමසීම නිමවීමෙන් පසු කිසිදු අවශ්‍යතාවක් සඳහා යොදවා ගැනීම පිණිස තබා නොගත යුතුය. තවද මූලික සංවිධාන කටයුතු සඳහා මෙවැනි වාහන ලබා නොගත යුතුය.</u>

**10. <u>කුලී පදනම මත ධාවනය කරන වාහන සඳහා ධාවන සටහන් පවත්වා ගැනීම.</u>**

කුලී පදනම මත ධාවනය කරනු ලබන පෞද්ගලික වාහන සහ වතු සමාගම්වලට අයත් වාහන සම්බන්ධයෙන් එම එක් එක් වාහනය වෙනුවෙන් ධාවන සටහන් පිළියෙළ කළ යුතුය. එය රජයේ වාහන වල ධාවන විස්තර සටහන් කිරීමට යොදා ගන්නා පොදු 268 ආකෘතියෙහි වූ ධාවන සටහන් පත්‍රයට අනුරූප විය යුතුය. ගමනේ යෙදෙන ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ නම හා ස්ථිර තනතුර සටහන් කිරීමට ද, ඔහුගේ සම්පූර්ණ අත්සන් යෙදීමට ද එම ආකෘතියේ ඉඩ සැලසිය යුතුය.

**11. <u>තැපැල් දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාහන</u>**

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ වාහන ප්‍රමාණවත් නොවිය හැකි අතර, එම කාර්යයට වාහන ඉල්ලා සිටියහොත් රජයේ වාහන කිහිපයක් සපයා දීම මැනවි. එහෙත් එම වාහනවලට අවශ්‍ය ඉන්ධන සඳහා වන වියදම් තැපැල් දෙපාර්තමේන්තුවෙන් දැරිය යුතුය. එම රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ආදිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වලින් ගෙවීම් කළ යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිදුර උපදෙස් සඳහා **LAE/2025/41** හා **2025.03.31**දිනැති චක්‍රලේඛය බලන්න.

**12. <u>ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය වාහන</u>**

**12.(i)** මෙම ඡන්ද විමසීමේදී ආරක්ෂක කටයුතු ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට වාහන සැළකිය යුතු ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත. <u>තේරීම්භාර නිලධාරීගේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් තිබේ නම්, පමණක්</u> ශ්‍රී ලංකා පොලීසියේ අවශ්‍යතා සඳහා රජයේ වාහන ලබාදීම මැනවි. <u>මෙසේ ලබාදෙන වාහන වලට අවශ්‍ය ඉන්ධන වියදම් ශ්‍රී ලංකා පොලීසියට වෙන් කර දී ඇති ප්‍රතිපාදන වලින් දැරිය යුතු වේ.</u> රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ආදී ගෙවීම් අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් කළ යුතුය. එසේ, රජයේ වාහන සපයා දීමට නොහැකි අවස්ථාවකදී, ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන්ට ඒ බව දැන්විය යුතු අතර, ශ්‍රී ලංකා පොලීසියේ අවශ්‍යතා සඳහා පොලිස්පතිගේ උපදෙස් අනුව ඔවුන් හට කුලී පදනම මත වාහන ලබාගත හැකිය. <u>එසේ ලබා ගන්නා වාහන වලට කුලී ගෙවීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා පොලීසිය විසිනි.</u> ඡන්ද විමසීමේදී ශ්‍රී ලංකා පොලීසියේ අවශ්‍යතා සඳහා ලබා ගන්නා පෞද්ගලික වාහන ධාවනයට එක් කිරීමට ප්‍රථම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කළයුතු අතර අවශ්‍යතා අනුව හා සුදුසු වාහන තෝරා ගැනීම ශ්‍රී ලංකා පොලීසියට කළ හැකි වේ.

**12:(ii)** පසුගිය ඡන්ද විමසීම් වලදී දිස්ත්‍රික්ක කිහිපයක පොලිස් නිලධාරීන්ට අවශ්‍ය වාහන තේරීම් භාර නිලධාරීන් විසින් කුලී ගෙවීමේ පදනම මත ලබාගත් වාහන අතුරින් ලබාදීම නිසා ගෙවීම් කිරීමේදී ගැටළු ඇතිවූ බවට මා වෙත වාර්තා වී ඇත. මෙම ඡන්ද විමසීමේදී එවැනි ගැටළු ඇති නොවීමට පූර්ව විධිවිධාන යෙදිය යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිදුර උපදෙස් අංක **LAE/2025/41** හා **2025.03.31** දිනැති චක්‍රලේඛයෙන් ලබාදී ඇත.

**13. <u>ශ්‍රී ලංකා යුද හමුදාව සඳහා අවශ්‍ය වාහන</u>**

ඡන්ද විමසීමේදී යුධ හමුදාව කිසියම් කාර්යයකට කැඳවන්නේ නම්, ඒ ශ්‍රී ලංකා පොලීසිය විසින් ඔවුන්ගේ සහායට විය යුතුය. එහෙයින් හමුදා අවශ්‍යතා සඳහා වාහන සැපයීම ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදුකළ යුතු අතර, ගෙවීම් පිළිබඳ වගකීම ශ්‍රී ලංකා පොලීසියට පැවරෙනු ඇත.

**14.** රජයේ වාහන ඡන්ද විමසීම් රාජකාරී වලට අදාල නොවන පෞද්ගලික ගමන් වල යෙදීම, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් රැගෙන එන වාහන සඳහා කුලී පදනම මත ලබාගන්නා ලද වාහන සඳහා ගෙවනු ලබන ගාස්තු මත ගෙවීම් කිරීම, සාවද්‍ය අන්දමින් නිලධාරීන්ට සැතපුම් ගාස්තු ගෙවීම, මාගේ අනුමැතියෙන් බැහැර කටයුතු වලට කුලී පදනම මත ලබාගන්නා ලද වාහන යෙදවීම චක්‍රලේඛයේ උපදෙස් වලට පරිබාහිරව ගෙවීම් කිරීම ආදිය සිදු නොකළ යුතුය. මෙම ඡන්ද විමසීමේදී එවැනි තත්වයන් වාර්තා

නොවන අන්දමින් කටයුතු කිරීමේ අවශ්‍යතාව ඔබගේ නිලධාරීන්ට කරුණාකර පැහැදිලි කර දෙන්න. මැතිවරණ රාජකාරී සඳහා අනුයුක්ත කර යවනු ලබන වාහන මැතිවරණ කටයුතු අවසන් වූ වහාම නිදහස් නොකර, ඒවා දින කිහිපයක් පමා කිරීම නිසා මැතිවරණයෙන් පසුව අදාල ආයතන වල රාජකාරී කටයුතු වලට බාධා පැමිණ තිබූ බවට තොරතුරු වාර්තා විය. එම තත්වයන් මත රජයේ ඇතැම් දෙපාර්තමේන්තු හා සංස්ථා ප්‍රධානීන් මැතිවරණ රාජකාරී සඳහා තම කාර්යාලයන්හි වාහන මුදා හැරීමට උනන්දු නොවන හෙයින් බැහැර දිස්ත්‍රික්කයන්හි රාජ්‍ය ආයතන වලින් ගෙන්වා ගනු ලබන වාහන මෙන්ම දිස්ත්‍රික්කය තුලින් ලබා ගන්නා වාහනද ඡන්ද විමසීම නිමවූ දිනට පසුදින පෙරවරුවේම සේවයෙන් නිදහස් කර යැවීමට විධිවිධාන යෙදිය යුතුය. ඡන්ද විමසීමේ රාජකාරී සඳහා රාජ්‍ය ආයතනයන්හි සංචිත වාහන කිසිදු නිලධාරියෙකුට ඡන්ද විමසීමේ රාජකාරී සඳහා ගෙන ඒම සපුරා තහනම් බැවින්**,** ඒ සඳහා කිසිදු විටක අනුමැතිය ලබාදීමක් නොකළ යුතුය. තම දිස්ත්‍රික්කයෙන් ලබාගන්නා රජයේ වාහන **හැර කොළඹ සංචිතයෙන් හෝ වෙනත් දිස්ත්‍රික්කයකින් එවනු ලබන රජයේ වාහන කිසිදු හේතුවක් මත ශ්‍රී ලංකා පොලිසියේ අවශ්‍යතාවන් සඳහා ලබා නොදිය යුතුය.**

## 15. ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම.

15.(i) ණය පහසුකම් යටතේ පොදු 231 ඇණවුම මගින් ඉන්ධන ලබා ගැනීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කළයුතු වේ.

I. අවශ්‍ය ඉන්ධන ඇණවුම් පොත් ගබඩාවෙන් ලබා ගැනීමේදී ඇණවුම් වල සඳහන් අංක පිළිවෙලට පොත් නිකුත් කිරීම හා භාර ගැනීම.

II. පොත් කිහිපයක් එකවර භාවිතා නොකිරීම සහ එක් පොතක් අවසන්වූ පසු පමණක් ඊලඟ පොත භාවිතයට ගැනීම. (ඇණවුම් අත්සන් කිරීමට නිලධාරීන් කිහිපදෙනෙකුට බලය ලබාදී ඇතිවිට ඔවුන් සඳහා වෙන වෙනම පොත් ලබාදිය හැකිය.)

III. ඉන්ධන ලබාගැනීම සඳහා **V-2** ආකෘතිය පරිදි සකසාගත් අයදුම්පතක් රියදුරන් ලවා සම්පූර්ණ කරවා ගැනීම.

IV. සිදුකිරීමට තිබෙන රාජකාරියට ප්‍රමාණවත් ඉන්ධන ප්‍රමාණය පමණක් ගණනය කර ලබාදීම. (කිසිවිටකත් අනවශ්‍ය පරිදි ඉන්ධන නිකුත් කිරීමෙන් වැළකිය යුතුය.)

V. හැකි සෑම විටම ඉන්ධන ලබා ගැනීමට ප්‍රථම ධාවන සටහන් තුලනය කර ඉදිරිපත් කරන ලෙසට රියදුරන් දැනුවත් කරන්න.

VI. ඉන්ධන නිකුත් කිරීම සඳහා ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර අවශ්‍ය විස්තර එහි ඇතුළත් කළ යුතුය. වැඩිදුරටත් තොරතුරු දැනගැනීම සඳහා **LAE/2025/22** හා **2025.03.31** දිනැති ප්‍රවාහන චක්‍රලේඛය බලන්න.

VII. ඉදිරි විගණන කටයුතු සඳහා මෙම තොරතුරු අවශ්‍ය වන හෙයින් මෙම ලේඛනය ඡන්ද විමසීම නිමවී සති දෙකක් ඇතුළත නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් භාරයට ගත යුතුය.

15.(ii) ඉන්ධන ඇණවුම් අත්සන් කිරීම නිලධාරීන් දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට සීමා කළයුතුය. ඉන්ධන ඇණවුම් අත්සන් කිරීමට බලය දී ඇති නිලධාරීන්ගේ නම්, නිල නාම, රාජකාරී ලිපිනයන් සහ ආදර්ශ අත්සන් ඉන්ධනහල් හිමියන් වෙත කල් වේලා ඇතිව ලබාදිය යුතුය.

15.**(iii)** ණය පහසුකම් යටතේ ඉන්ධන ලබා ගැනීම සඳහා වාහනය රියදුරු සමග පමණක් නොයැවිය යුතු අතර, <u>සෑම විටම කළමනාකරණ සේවා නිලධාරියෙකු හෝ වෙනත් සුදුසු නිලධාරියෙකු සමග යැවිය යුතුය.</u> අදාළ නිලධාරියා ඉදිරිපිටදී වාහනයේ ටැංකියට ඉන්ධන පිරවූ බවට ඇණවුමේ වම්පස ඉහළ කෙළවරේ සටහනක් යෙදිය යුතුය. මෙම සටහන පහත ආදර්ශය පරිදි රබර් මුද්‍රාවකින් තැබීමට කටයුතු කළ හැකිය.

| | | |
|---|---|---|
| මා ඉදිරියේදී අංක .................... දරණ වාහනයේ ඉන්ධන ටැංකියට ඉන්ධන ලීටර් ................ ක් පුරවන ලදී. මයිලෝ මීටරයේ කියවීම ................................ | | |
| ................................<br>දිනය | ...............................<br>වේලාව | ....................................<br>අත්සන |

15.(iv) මැතිවරණ රාජකාරී සඳහා රාජ්‍ය ආයතන වලින් ගෙන්වා ගනු ලබන වාහන වලට, සංචිත වාහන (Pool Vehicles) සඳහා ඉන්ධන ලබා දීමේදී මෙම විධිවිධාන අදාළ වේ. වාහන වලට ලබාදුන් ඉන්ධන සඳහා වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා **PV – 01** ආකෘතිය භාවිතා කළ යුතුවේ.

## 16. <u>හදිසි අනතුරු වලට මුහුණ දෙන රජයේ වාහන සම්බන්ධව කටයුතු කිරීම.</u>

**16.**(i) මැතිවරණ රාජකාරිවල නිරත කරවන ලද වාහනයක් හදිසි අනතුරකට මුහුණ දුනහොත් සාමාන්‍ය මාර්ග අනතුරකදී අනුගමනය කළ යුතු පරිදිම පොලීසියට වාර්තා කර අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. ඊට පහත දැක්වෙන ක්‍රියාමාර්ග ද ඇතුළත් විය යුතුය.

- අනතුර පිළිබඳව නොපමාව ළඟම ඇති පොලීසියට දැන්වීම.
- වාහනය පූර්ණ රක්ෂණය කර ඇත්නම්, අදාළ රක්ෂණ ආයතනයට දැන්වීම.
- අනතුර සිදුවන අවස්ථාවේ රථය පැදවූ රියදුරුගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීම.
- අනතුර සිදුවන අවස්ථාවේ රථයේ ගමන් කළ වෙනත් පුද්ගලයින් වී නම්, ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර වාර්තාවක් ලබාගැනීම.
- අනතුර සිදුවූ ස්ථානයේ දළ සැලැස්මක් ලබා ගැනීම.
- රථයට සිදුවී ඇති හානි පිළිබඳව යාන්ත්‍රික ඉංජිනේරු වරයෙකු / මෝටර් රථ පරීක්ෂක වරයෙකු ලවා පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීම.

16.**(ii)** රථය පූර්ණ රක්ෂණය කළ එකක් නම්, අලාභය අදාල රක්ෂණ ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එහිදී සම්පූර්ණ අලාභයම ප්‍රතිපූර්ණය නොවේ නම් එය පියවීම සඳහා සියළු විස්තර ඇතුළත් ඔබගේ නිර්දේශිත වාර්තාවක් මා වෙත එවිය යුතුය. අනතුරට පත් රථය අළුත්වැඩියා කිරීමට ප්‍රතිපාදන මැතිවරණ කොමිෂන් සභාවේ වැය ශීර්ෂ වලින් දරණු ලබන්නේ නම් ඉහත **16.(i)** ඡේදයේ සඳහන් ලිපි ලේඛනවලට අමතරව පහත සඳහන් විස්තරද මා වෙත එවිය යුතුය.

- අනතුර සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා විසින් පත් කල පරීක්ෂණ මණ්ඩලයක අවසන් වාර්තාව
- රථයට සිදුවී ඇති හානි පිළිබඳ සම්පූර්ණ විස්තරයක්

- දිස්ත්‍රික් මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් සමග දළ ඇස්තමේන්තුවක්
- පොලිස් වාර්තාවේ සහතික කළ පිටපතක්
- අළුත්වැඩියාව සිදුකල රජයේ ලියාපදිංචි ගරාජය වෙතින් ලබාගත් ඇස්තමේන්තුවේ මිළ ගණන් සාධාරණ බවට දිස්ත්‍රික් මෝටර් රථ පරීක්ෂක වෙතින් ලබාගත් නිර්දේශයේ පිටපත
- අළුත්වැඩියාව පිළිබඳ ඔබගේ නිර්දේශය

16.**(iii)** එමෙන්ම අනතුර පිළිබඳව මා වෙත ද වාහනය අයත් ආයතනයේ ප්‍රධානියා / ප්‍රවාහන නිලධාරී වෙතද නොපමාව දැනුම් දිය යුතුය. තවද, එවැනි අනතුරු පිළිබඳව ඔබට ද නොපමාව වාර්තා කරන ලෙස ප්‍රවාහන කටයුතු භාර නිලධාරීන්ට දැනුම් දෙන්න.

16.**(iv)** කෙසේ වෙතත්, මාර්ග නීති උල්ලංඝණය කිරීමක් හෝ බීමතින් රිය පැදවීම මත හෝ, රාජකාරියෙහි යෙදුන රියදුරු අධිකරණයක් වෙත ඉදිරිපත් කර වරදකරුවකු වී ඇත්නම්, අදාල අලාභයන් ප්‍රතිපූරණය කිරීම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථම පූර්ණ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට වාහනය අයත් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / සංස්ථාව වෙත දැන්විය යුතුය. එම වාර්තාවේ නිර්දේශයන් මත අලාභය ප්‍රතිපූරණය කිරීම පිළිබඳව සළකා බලනු ලැබේ. **LAE/2025/23** හා **2025.03.12** දිනැති චක්‍රලේඛය බලන්න.

**17.** <u>මැතිවරණ රාජකාරී අතරතුරදී කාර්මික දෝෂ වලට ලක්වන රජයේ වාහන.</u>

17.(i) මැතිවරණ රාජකාරී සඳහා යොදා ගැනීම පිණිස කැඳවන ලද රජයේ වාහනයක් හෝ නිලධාරීන් විසින් රැගෙන එන ලද රජයේ වාහනයක් හෝ කාර්මික දෝෂයකට ලක් වුවහොත්, එම වාහනය අළුත්වැඩියා කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

1. කාර්මික දෝෂය හා කළයුතු අළුත්වැඩියාව පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් ලබා ගැනීම (එසේ නොමැති ස්ථානවල යාන්ත්‍රික ඉංජිනේරුගේ සහාය ලබාගත හැකිය.) එහිදී එම දෝෂය හදිසියේ ඇතිවූ තත්වයක් බව සනාථ කරගත යුතුය.
2. රජයේ වාහන නඩත්තු කිරීම මැයෙන් **2016.12.29** දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **30/2016** පරිදි කටයුතු කල යුතුය.
3. එහිදී ලබා ගන්නා මිළ ගණන් පිළිබඳව මෝටර් රථ පරීක්ෂකගේ හා නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්ගේ නිර්දේශ සමග නොපමාව **0112885228** දරණ ෆැක්ස් අංකය මගින් අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවා මාගේ අනුමැතිය ලබා ගැනීම.

17.(ii) මාගේ අනුමැතිය ලද පසු අළුත්වැඩියාව සිදු කර, ඒ පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන පරීක්ෂකගේ වාර්තාව සමග අවසාන බිල්පතේ පිටපතක් ද, අළුත්වැඩියාව පිළිබඳව අදාළ ආයතනය මගින් ලොග් සටහන් තැබූ බවට වාර්තාව ද, ඔබගේ නිර්දේශිත වාර්තාව ද අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත නොපමාව එවීමට කටයුතු කරන්න. වැඩිදුර උපදෙස් සඳහා **LAE/2025/23** හා **2025.03.31** දිනැති චක්‍රලේඛය බලන්න.

18. **2025.05.06** දින පැවැත්වෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කර ඇති සියළුම ප්‍රවාහන චක්‍රලේඛ සහ ආකෘති පත්‍ර, මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.gov.lk යන වෙබ් අඩවිය මගින් ද ඔබට ලබාගත හැකි බව කාරුණිකව සළකන්න.

19. ඇමුණුම 01 හි සඳහන් ආකෘති පත්‍ර අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවමි.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත් :

| | |
|---|---|
| 1. පොලිස්පති (වැ.බ) පොලිස් මූලස්ථානය<br>2. තැපැල්පති, තැපැල් මූලස්ථානය<br>3. විගණකාධිපති | - කාරුණික දැනගැනීම සඳහා |
| 4. සභාපති, ශ්‍රී ලංකාගමනා ගමන මණ්ඩලය | - මෙම චක්‍රලේඛයේ 06 වන ඡේදයේ සඳහන් පරිදි අවශ්‍ය කටයුතු කිරීම සඳහා කාරුණිකව. |
| 5. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ / පාලන)<br>6. ප්‍රධාන මූල්‍ය නිලධාරි<br>7. ප්‍රධාන අභ්‍යන්තර විගණක | කාරුණික දැන ගැනීම සඳහා |
| 8. ගණකාධිකාරි (ප්‍රසම්පාදන) | - CE-51 ආකෘති පත්‍ර ඒ ඒ දිස්ත්‍රික්කයන් විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයන්ගෙන් සැපයීමට කටයුතු කිරීම සඳහා |
| 9 .ගණකාධිකාරි (ගෙවීම්) | - දැන ගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා |